**කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

# කන්දහන්දිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාර පරිශ්‍ර බදු පදනම මත ලබා දීම සඳහා අයදුම්පත් කැඳවීම

කෘෂි නිෂ්පාදන වලට සාධාරණ මිලක් හා තරඟකාරී වෙළඳපොළක් සඳහා අවස්ථාවක්ද පාරිභෝගිකයින් හට සාධාරණ මිලකට භාණ්ඩ ලබා දීමේ අරමුණින්ද කන්දහන්දිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදි කර ඇති කන්දහන්දිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි ව්‍යාපාර පරිශ්‍රය බදු පදනම මත ලබා දීමට 2021.02.03 දින පුවත්පත් දැන්වීම පළ කර 2021.02.03 සිට 2021.02.17 දින දක්වා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකින් අයදුම්කරුවන් තෝරා ගැනීමෙන් අනතුරු ව තවදුරටත් ඉතිරි වූ ව්‍යාපාර පරිශ්‍ර 14 බදු පදනම මත ලබා දීම සඳහා නැවත අයදුම්පත් කැඳවීමට අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත.

මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පහත සඳහන් පහසුකම් වලින් සමන්විතය.

- මුළු ව්‍යාපාර පරිශ්‍ර 25 කි. ඉන් **පරිශ්‍ර 14 ක්** බදු පදනම මත ලබා දීමට නියමිතය.
- රථ වාහන නැවතීමේ පහසුකම්
- විදුලිය, ජලය සහ සනීපාරක්ෂක පහසුකම්

**පොදු කොන්දේසි**

1. එක් අයදුම්කරුවෙකුට ලබා දෙනු ලබන්නේ එක් ව්‍යාපාර පරිශ්‍රයක් පමණි.
2. කන්දහන්දිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි රාගල පාරට මුහුණලා පිහිටි R 01 සිට R 11 දක්වා ව්‍යාපාර පරිශ්‍ර 11 තොග අලෙවිය සඳහා පමණක් ලබා දෙනු ලබන අතර නුවර පාරට මුහුණලා පිහිටි K 01 සිට K 14 දක්වා කඩකාමර 14 සිල්ලර වෙළඳාම සඳහා ලබා දීමට යෝජිත වේ.
3. තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට ව්‍යාපාර පරිශ්‍ර ලබා දීමට පෙර ආරක්ෂිත ඇප මුදල වශයෙන් අදාල පරිශ්‍රය සඳහා වන මාසික කුලිය මෙන් මාස දොළහක (12) කුලී මුදලකට සමාන මුදලක් ආපසු ගෙවනු ලබන මුදලක් වශයෙන් කළමනාකරණ භාර ගිණුමේ තැන්පත් කළ යුතුය.
4. එක් ව්‍යාපාර පරිශ්‍රයක් සඳහා මාසික කුළිය **රු. 4500.00** කි.

මේ සඳහා වන විස්තර තොරතුරු ඇතුලත් අයදුම්පත් කට්ටලය **2021 සැප්තැම්බර් මස 10** සිට **2021 ඔක්තෝබර් මස 15** දින දක්වා කාර්යාල දින වල **පෙ.ව. 9.00** සිට **ප.ව. 2.30** දක්වා නො.80 "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර බත්තරමුල්ල පිහිටි **කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය** අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත **ආපසු නොගෙවනු** ලබන **රු.500/-** ක මුදලක් ගෙවීමෙන් ලබා ගත හැකිය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - 2021.10.15**

ලැබෙන අයදුම්පත් අතරින් ඉල්ලුම්කරුවන්ගේ මූල්‍යමය, ව්‍යාපාරික සහ අනිකුත් දක්වා ඇති සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයක් මඟින් පූර්ව පරීක්ෂාවට ලක් කර සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් තෝරා ගැනීම සම්බන්ධ අවසාන තීරණය ගැනීමේ අයිතිය අමාත්‍යාංශ සතු වේ.

මේ සම්බන්ධයෙන් වන වැඩිදුර තොරතුරු දුරකථන අංක 011-2034300 අමතා අමාත්‍යාංශයේ සංවර්ධන අංශයෙන් සහ ලබා ගත හැකිය.

**ලේකම්,**
**කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය.**

**දුරකතන : 0112 - 883829**